# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1991/35 - 2016 නොවැම්බර් මස 02 වැනි බදාදා - 2016.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

LDB 11/2016

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 105 ආ වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 212 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 නොවැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

මෙම නියෝග 2016 අංක 01 දරන ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**I වන කොටස**

***වාර්තා සහ ඊට සම්බන්ධ ලිපිලේඛන ඉදිරිපත් කිරීම***

2. බදු ගෙවන්නා විසින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පනත්වල කාර්ය සඳහා (මෙහි මින්මතු ''කොමසාරිස් ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන සහ (මෙහි මින්මතු ''වෙබ් ද්වාරය'' යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙබ් ද්වාරයේ පළ කර ඇති ආකාරයට සහ ආකෘති අනුව වාර්තා, ලිපිලේඛන සහ ඊට සම්බන්ධිත උපලේඛන ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කළ යුතු ය.

**II වන කොටස**

***කාර්යපටිපාටිමය අංගයන්***

3. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් පහත කරුණු නියම කරනු ලැබිය යුතු ය :-

(අ) වෙබ් ද්වාරය ඔස්සේ විවිධ බදු වර්ග ඉලෙක්ට්‍රොනිකව ලියාපදිංචි කිරීමට අදාළ කාර්යපටිපාටිය සහ ඉදිරිපත් කළයුතු ලිපිලේඛන ;

(ආ) වාර්තාව වලංගු වාර්තාවක් ලෙස සැළකීම පිණිස එම වාර්තාව සමග ඉදිරිපත් කළයුතු ලිපිලේඛන සහ උපලේඛන, වෙබ් ද්වාරයෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි අදාළ උපලේඛන ඉදිරිපත් කරනු නොලබන්නේ නම් වාර්තාව සැකසීම නොකළ යුතු ය.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ඇ) බදු ගෙවන්නා වෙනුවෙන් ලේඛන ඉදිරිපත් කිරීමට පහසුකම් සැළසීම සඳහා ද වෙබ් ද්වාරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරනු ලබන කාර්යමණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාවක් ලියාපදිංචි කිරීම සඳහා ද;

(i) ''බදු අනු නියෝජිතයා'' හෝ ඔහුගේ කාර්ය මණ්ඩලය,

(ii) බලයලත් තැනැත්තෙක්,

ලියාපදිංචි කිරීමේ කාර්යපටිපාටිය හා අවශ්‍යතා.

**III** වන කොටස

*පොදු විධිවිධාන*

4. සියලුම ඊ - සේවා ගනුදෙනු කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකෘති පත්‍ර මගින් සිදු කළ යුතු ය.

5. තක්සේරුව කිරීමට අදාළ නිශ්චිත හේතු ද මුද්‍රණය කර ඇති තක්සේරුවක්, එය පද්ධතිය මගින් ජනනය වීම හේතුවෙන්, එහි වලංගුභාවයට බලපෑමක් නොවිය යුතු ය. එම තක්සේරුව, වාර්තාව ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වමින් නිකුත් කරනු ලබන තක්සේරුවක් ලෙස නොසැළකිය යුතු ය.

6. වාර්තාව, අභියාචනා හෝ හිඟ බදු සඳහා විරෝධතා පිළිගත් බව අදාළ පනත්වල අදාළ විධිවිධානවල සඳහන් නිශ්චිත කොන්දේසි පරීක්ෂා කිරීමෙන් පසුව දැන්විය යුතු ය. ලිපිලේඛන ලැබුණු බවට කරනු ලබන තාවකාලික දැන්වීම, වාර්තාව, අභියාචනය හෝ හිඟ බදු සඳහා විරෝධතා පිළිගත් බවට කළ දැන්වීමක් ලෙස නොසැළකිය යුතු ය.

7. අදාළ විෂයය සම්බන්ධයෙන් කටයුතු කරන විශේෂ නිළධාරියකුගේ අත්සන ඇතුළත් නොවන්නාවූ ලිපි, දැන්වීම්, ලැයිස්තු සහ වෙනත් යම් ලිපි පද්ධතිය තුළින් ජනනය වීමෙන් එම ලේඛනවල වලංගුභාවයට බලපෑමක් නොවිය යුතු ය.

8. අනපේක්ෂිත බාධාවීමක් මත මූලාශ්‍රය භාවිතයට ගැනීමට නොහැකිවන ඉලෙක්ට්‍රොනික පද්ධතියේ බිඳවැටීමක් හෝ යම් ස්වාභාවික හෝ වෙනත් ආපදාවක් සම්බන්ධයෙන්, පරිපාලනමය වශයෙන් වඩාත් යෝග්‍ය යැයි සැළකෙන ආපදා සහන ක්‍රියාවලියක් තීරණය කිරීමට කොමසාරිස් ජනරාල්වරයාට බලය තිබිය යුතු ය.

9. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු ගෙවන්නන් වෙත යවන ලද ලිපිලේඛන ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ලද සියලු ලිපිලේඛන ද, ලිපිලේඛන කළමනාකරණ පද්ධතියෙහි (DMS) ගබඩා කර තැබිය යුතු ය.

10. අදාළ පනත්වල විධිවිධාන යටතේ ඉදිරිපත් කළ යුතු බවට සැළකෙන (වාර්තා හැර) ප්‍රකාශන, ආකෘතිපත්‍ර හෝ උපලේඛන හෝ වෙනත් යම් ලේඛන බදු ගෙවන්නා වෙනුවෙන් බලයලත් යම් තැනැත්තකු විසින් හෝ බදු අනු නියෝජිතයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර සියලු කාර්ය සඳහා එකී ලේඛන බදු ගෙවන්නා විසින් ඉදිරිපත් කරන ලද ලේඛන ලෙස සළකනු ලැබිය යුතු ය. එකී බලයලත් තැනැත්ත හෝ බදු අනු නියෝජිතයා විසින් ඉදිරිපත් කරනු ලබන එකී ප්‍රකාශන, ආකෘති පත්‍ර, උපලේඛනවල හෝ අනෙකුත් ලේඛනවල අඩංගු සියලු කරුණු දන්නා ලෙස සැලකිය යුතු ය. වාර්තා භාරදීම බදු ගෙවන්නා හෝ අනුමත කරන්නා තත්වය ලැබූ බලය ලත් යම් තැනැත්තෙකු විසින් පමණක් සිදු කළ යුතුය.

11. මෙම නියෝග වල -

''බලයලත් තැනැත්තා'' යන්නෙන් කාර්යමණ්ඩලයට බලය පැවරීමේ කාර්යපටිපාටිය යටතේ බදු ගෙවන්නා විසින් බලය පවරන ලද කාර්යමණ්ඩලයේ සාමාජිකයෙක් අදහස් වේ.

''ආපදා සහන'' යන්නෙන් ස්වාභාවික හෝ අනපේක්ෂිත බාධාවීම් මත මූලාශ්‍ර භාවිතයට ගැනීමට නොහැකි වන ආකාරයේ වෙනත් ආපදාවක් හෝ සමබන්ධයෙන් තොරතුරු තාක්ෂණ පරිසරයේ ප්‍රතිසාධන සැළැස්මක්, සැළසුම් කිරීමේ, සංවර්ධනය කිරීමේ, පරීක්ෂා කිරීමේ, පවත්වාගෙන යාමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය අදහස් වේ.

''ඊ - සේවාව'' (e-Service) යන්නට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු ගෙවන්නන් වෙත (බදු අනුයෝජිතයන් ඇතුළත්ව) දත්ත තොරතුරු සහ වෙනත් අදාළ විස්තර බාගත කර ගැනීම සඳහා සේවා සැපයීමට සහ වෙබ් ද්වාරය හි පළ කර ඇති පරිදි දේශීය කොමසාරිස් ජනරාල් විසින් නියම කර ඇති යම් වාර්තා, උපලේඛන සහ වෙනත් යම් තොරතුරු ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සම්පූර්ණ කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා වර්ෂයකට දින 365 ක් සහ දිනකට පැය 24 ක් (අලුත්වැඩියා කිරීම හෝ ආපදා සහන සඳහා අවශ්‍ය කාලයට යටත්ව) විවෘතව පවතින අන්තර්ජාල වෙබ් අඩවි සහ මෘදුකාංගය ද ඇතුළත් වේ.

''බදු අනුයෝජිතයා'' යන්නෙන් ඊ සේවාවල කාර්ය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන යම් බද්දක් සම්බන්ධයෙන් බදු ගෙවන්නා වෙනුවෙන් කොමසාරිස් ජනරාල්වරයා සමග සම්බන්ධීකරණය කිරීමට, සහ වාර්තා හා උපලේඛන සකස් කිරීමට බදු ගෙවුම්කරු විසින් පත් කරනු ලැබූවා වූ ((1) වන ඡේදයේ (අ) අනුඡේදයේ iv වන අයිතමය යටතේ සහ (ආ), (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) අනුඡේද යටතේ සඳහන් තැනැත්තකු හැර) 217 වන වගන්තිය යටතේ අර්ථ දක්වා ඇති බලයලත් නියෝජිතයකු වන, අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් හෝ එවැනි යම් බදු ගෙවුම්කරුවකු වෙනුවෙන් ක්‍රියාකරන උපයන විට ගෙවීමේ බදු ගණනය කිරීම සඳහා විශේෂඥතාවක් ඇති යම් සමාගම් ලේකම් ආයතනයක් හෝ වෙනත් ආයතනයක පළපුරුද්ද ඇති යම් පුද්ගලයකු ලෙස එකී අර්ථ නිරූපනයේ (2) වන ඡේදයේ සඳහන් සුදුසුකම් ඇති අනු නියෝජිතයෙක් අදහස් වේ.

## උපලේඛනය

(අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත;

(ආ) 2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත;

(ඇ) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ පනත;

(ඈ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත;

11 - 861

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.